01.08.2019

ශ්‍රේණිය 10

දෙවන වාර පරීක්ෂණය - 2019

පෙරදිග සංගීතය

කාලය පැය 01

01. විවාදි ස්වර ලෙස රි,ග,ම,ධ,නි යන ස්වර යොදා ගන්නා රාගය කුමක්ද?

i. කාෆි ii. භෛරවී iii. යමන් iv. භූපාලි

02. කිසියම් රාගයකට අදාලව ලක්ෂණ ඇතුලත් කරමින් තාලයකට අනුව ප්‍රබන්ධ කර ඇති ගීත ශෛලිය වන්නේ,

i. සර්ගම් ii. ඛ්‍යාල් iii. ලක්ෂණ ගී iv. ස්වරස්ථාපන ගී

03. සංගීත සම්භවය නම් ග්‍රන්ථය රචනා කලේ,

i. ඩබ්ලිව්. බී. මකුලොලුව මහතාය.
ii. වින්සන්ට් සෝමපාල මහතාය.
iii. ආනන්ද ජයසිංහ මහතාය.
iv. සී.ද එස් කුළතිලක මහතාය.

04. ඍිධනිරිස, ඍිධනිරිගරිස......... යන ස්වර අභ්‍යාසයේ යමන් රාගයට අනුව ඊළග පියවරට අදාළ ස්වර ඛණ්ඩය වන්නේ,

i. නි,ධ,නි,රි,ග,ම්,ග,රි,ස
ii. නි,ධ,නි,රි,ග,ම්,ග,රි,ස
iii. නි,ධ,නි,රි,ග,ප,ග,රි,ස
iv. නි,ධ,නි,රි,ග,ප,ම්,ග,රි,ස

05. භෛරවී සහ යමන් රාග යුගලය සඳහා පොදුවේ අදාළ වන කරුණ තෝරන්න.

i. වාදිසංවාදී සමාන වේ
ii. සංවාදිස්වරය සමාන වේ
iii. එකම මේලයකටම අයත්වේ
iv. සම්පූර්ණ ජාතියට අයත්වේ

06. ස්වර සප්තකය තුල ඇති අර්ධ ස්වර පරතරයක් සහිත ස්වර යුගලය තෝරන්න.

i. නි,ධ ii. ප,ම iii. ම,ග iv. රි,ස

07. පහත ප්‍රකාශ වලින් විස්තර කෙරෙන ගායන ශෛලිය කුමක්ද?

- ස්වර පමණක් යොදා ගැනීම.
- කාලානු කූලව ප්‍රබන්ධ කර තිබීම.
- රාග සංගති අන්තර්ගත වීම.

i. ඛ්‍යාල් ii. සර්ගම් iii. මධ්‍යලය ගී iv. ලක්ෂණ ගී

08. නි,ධ,ග,ම,ප,ධ,ප........ යන ස්වර සංගතිය අයත් රාගය වන්නේ.

i. භෛරවී ii. භූපාලි iii. කාෆි iv. යමන්

09| ස-ග | ම-ප | % |

ඉහත ප්‍රස්තාර කොටසේ තෙවන විභාගයේ දක්වෙන සංකේතයෙන් අදහස් කරනුයේ,

i. තෙවන විභාගය නිහඬව සිටිය යුතු බවයි.
ii. දෙවන විභාගයේ ස්වර නැවත වාදනය කලයුතු බවයි.
iii. මුල් විභාග දෙකේම ඇතුළත් ස්වර නැවත වාදනය කළ යුතු බවයි.
iv. මුල් විභාගයේ ස්වර නැවත වාදනය කළ යුතු බවයි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

10. |ග-ම| ප-ග| ම-ග| රි - - |

ඉහත ස්වර පාදය හා සුසංගත ( Harmony ) වන ස්වර පාදය කුමක් ද?

i. ස-රි ග-ම රි- ස - -
ii. ප-ධ නි-ප ධ-ප ම --
iii. රි-ග ම-රි ප-ම ග - -
iv. ම-ප ධ-ම ප-ම ග - -

11. ගීත තැටිගත කිරීමේ තාක්ෂණයේ ආරම්භක පියවර වනුයේ,

i. CD තැටියයි.
ii. ග්‍රැමෆෝන් තැටියයි.
iii. DVD තැටියයි.
iv. VCD තැටියයි.

12. ගුවන් විදුලි සරල ගීයට මුල් අත්තිවාරම සකසනු ලැබූ සංගීතඥයකු වන්නේ,

i. ඩබ්ලිව්. ඩී. අමරදේව
ii. ආර්. ඒ. චන්ද්‍රසේන මහතා
iii. සී.එල්. එ. සෝමපාල මහතා
iv. ආනන්ද සමරකෝන් මහතා

13. /xx/xxx/xx/xxx/ මෙම රිද්ම රටාව දැක්වීමට බටහිර සංගීතයේ යෙදෙන Time sigiture කුමක් ද?

i. $5/8$
ii. $2/4$
iii. $7/8$
iv. $3/4$

14. ස්වර මාලිකා යනු,

i. ලක්ෂණ ගී වේ
ii. ඛයාල්වේ
iii. සර්ගම් වේ
iv. පල්ටාවේ

15. දිවා දෙවන ප්‍රහාරය යනු දවසේ කුමන කාල පරාසය ද?

i. ප.ව 9.00-12.00
ii. පෙ.ව 6.00-9.00
iii. පෙ.ව 9.00-12.00
iv. ප.ව 6.00-9.00

16. සප්තක තුනම ඇසුරු කර ඇති ස්වර ඛණ්ඩය දක්වෙන පිළිතුරු තෝරන්න,

i. ප̣ නි̣ රි ම ප නි ස̇
ii. ප ධ නි ස̇ රි̇ ග̇ ම̇
iii. ස ග ම ප ධ නි ස
iv. රි ග ම ප̇ ධ̇ නි̇ ස̇

17. භෛරවි රාගය ඇසුරෙන් තනු නිර්මාණය නොවූ ග්‍රැමෆෝන් ගීතය කුමක් ද?

i. මහ බෝධිමූලේ....
ii. එන්න මද නලේ....
iii. අඳුර අඳුර මගේ
iv. සුපිපුණු සුගන්ධ යුක්...

18. මව් පියෝ ආදී සොඳුරු කමාගේ... බැස සීතල ගඟුලේ... සිරිබුද්ධ ගයා විහාරේ වැනි ගීත වර්ග කළ හැකිවන්නේ,

i. නාඩගම් ගී
ii. නූර්ති ගී
iii. නවනාට්‍ය ගී
iv. ග්‍රැමෆෝන් ගී

19. එක් විකෘති ස්වරයක් පමණක් යෙදෙන රාගය කුමක්ද?

i. බිලාවල්
ii. යමන්
iii. කාෆි
iv. භෛරවි

20. පැහැසරණිය මිණි පැමිණිය....... නම් ගීතය.

i. දෙකිස්මත්තේ ගීයකි.
ii. ආඝාතාත්මක සේ ගීයකි.
iii. අනාඝාතාත්මකසේ ගියකි.
iv. දොළොස්මත්සේ ගීයකි.

21. පහත සඳහන් ගීත අතරින් සොළොස්මත් සේ ගීයක් ලෙස සැලකිය හැකි ගී පාදය තෝරන්න.

i. රූ රැසේ අඳිනා ලෙසේ.....
ii. රැගත් සුරාසිරුවිතින්.....
iii. සඳවා සුදුවැලි පිවිතුරු.....
iv. මන්මත් කරවන......

22. මෙහෙ ගී, බැති ගී, සමාජීය ගී මේ සියල්ල හැඳින්විය හැකි පොදුනාමය කුමක්ද?

i. ගැමි ගී
ii. සේ ගී
iii. ජන ගී
iv. අනාසාතාත්මක ගී

23. ගීතය ගායනයේ දී වඩාත් හොඳින් හැඟීම් ප්‍රකාශනය සිදු කළ හැකි ගීත විශේෂය දක්වෙන පිළිතුර තෝරන්න.

i. සමාජයීය ගී
ii. අනාසාතාත්මක ගී
iii. කෙළි ගී
iv. ආසාතාත්මකමෙහෙ ගී

24. නාඩගම් ගීතයක නාදමාලාව සෘජුවම දකගත හැකිවන නාට්‍ය ගීතය තෝරන්න.

i. මැවේ මාදුටු කොමළ ලියා
ii. ගල්ලෙන බිඳලා
iii. ප්‍රේමයෙන් මන රංජිත වේ
iv. අම්බරයේ සඳ සේ දිලේ

25. ''ස''ස්වරයහා''රි''ස්වරය එකිනෙක වෙනස් වේ. එය නාදයේ කුමන ගුණයද?

i. තාරතාවය
ii. විපුලතාවය
iii. ධවනි ගුණය
iv. හඬෙසැර

26. තත් භාණ්ඩයක එකම ස්වරයක් පෙළිමේ බර අඩු වැඩි කරමින් වාදනය කරනවිට නාද තරංගයේ යම් වෙනාස්ක් සිදුවේ. එම වෙනස දැකිය හැක්කේ,

i. තරංගයේ හැඩයේ ය.
ii. තරංග ලායාමයේ ය.
iii. තරංග සංඛ්‍යාතයේ ය.
iv. තරංග වීස්තාරයේ ය.

27. සිතාරයෙන් හා එස්රාජයෙන් නිකුත් වන නාදය එකිනෙකට වෙනස් ය. මෙග නාදයේ,

i. විපුල තාවයයි.
ii. ධ්වනි ගුණයයි.
iii. තාරතාවයයි.
iv. විස්තාරයයි.

- පහත සඳහන් ගී පාදය ඇසුරෙන් ප්‍රශ්න අංක 28 -30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| ස ද ක්/ සේ ඹ බ/ එ ළි ය/ දෙනුමැ න/

28. ඉහත සඳහන් ගී පාදය සඳහා වාදනය කළයුතු තාලය කුමක් ද?

i. ත්‍රිතාලය
ii. ජප් තාලය
iii. දීප්චන්දි තාලය
iv. මකහෙර්වා තාලය


29. එම තාලයේ බලි ස්ථානය පිහිටා ඇත්තේ,


i. හතරවන මාත්‍රාව මතය,
ii. අටවන මාත්‍රාව මතය,
iii. පස්වන මාත්‍රාව මතය,
iv. නවවන මාත්‍රාව මතය


30. එම තාලයට අනුව ගැයෙන සරල ගීත තෝරන්න.


i. සැදැ කළුවර...
ii. රන්වන් කරල් සැලෙයි...
iii. මිහිකත නලවාලා...
iv. බැසසීතල ගඟුලේ...

- ජන සංගීත ක්ෂේත්‍රයේ උන්නතියට දායක වූ සංගීතඥයින් සිව් දෙනෙකු පහත දැක්වේ. ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක 31 සිට 33 දක්වා පිළිතුරු සපයන්න.

A


B


C


D


31. 0 ලංකාවේ සංගීත සම්භවය කෘතිය රචනා කරන ලද සංගීතඥා දක්වෙන අක්ෂරය වන්නේ,

i. A ii. B iii. C iv. D

32. ''මේ අවුරුදු කාලේ '' ''මල් සරා බැල්ම මෙලා''යන ගී නිර්මාණය සඳහා දායක වූ සංගීතඥයින් දෙදෙනා තෝරන්න.

i. A හාB ii. CහාD iii. BහාD iv. A හාC

33. ජන නාද රටා ඇසුරින්''දෙපානෝ''ගීතනාටකය නිර්මාණය කරන ලද සංගීතඥයාකවු ද?

i. A ii. B iii. C iv. D

34. පැරණි කාව්‍ය ග්‍රන්ථයකින් උපුටා ගත් කවියක්, ගීතයක් වූ අවස්ථා ව මින් කුමක්ද?

i. රුක්අත්තන මල මුදුනේ...

ii. රූ රැසේ අඳිනා ලෙසේ අත්...

iii. දෑතට වළළු

iv. කඳුළුහෙලානැඹිලියට...

35. රිද්මයටඅනුව නර්තනයේ යෙදෙමින්වින්දනාත්මකය ගයනු ලබන ගීත විශේෂය මින් කුමක් ද?

i. චිත්‍රපට ගී ii. සරල ගී iii. කපිරිඤ්ඤා ගී iv. ග්‍රැමෆෝන් ගී

36. අර්ධ ශෛලිගත නාට්‍යයකි,

i. සිංහබාහු

ii. නරිබෑනා

iii. මනමේ

iv. හුණු වටේ

37. අවග්‍රහයෙන් හා විෂම ග්‍රහයෙන් ගායනා කළහැකි ගී පාද පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

i. මිහිකත නලවාලා.../ මධුරයාමේ...

ii. මධුරයාමේ.../ සවාලා විළඳ ජාතී...

iii. මේසිංහල අපගේ.../ දුනුකෙයියා මලක් වගේ...

iv. අයන්නකියන්නා.../ සසරවසන තුරු....

38. සසරිරිගුගුමමප........, රිනිධනිපධමප යන සංගීතය හිමි රාගය

i. බිලාවල්

ii. භෛරවී

iii. කාෆි

iv. යමන්

39. කායදා, පල්ටා, පරන්, තිහායි, රේලා ආදි කොටස් වාදනය දැක ගත හැකිවන්නේ,

i. ශාස්ත්‍රීය තබ්ලා වාදනයකදී

ii. ශාස්ත්‍රීය සිතාර් වාදනයකදී

iii. ශාස්ත්‍රීය වයලීන් වාදනයක දී

iv. ශාස්ත්‍රීය බටනලා වාදනය කදී

40. ගගරිස ධ්‍රධ සරි සංගතිය හිමි රාගය

i. භූපාලි

ii. භෛරවී

iii. යමන්

iv. කාෆි

01 . 08 . 2019

දෙවන වාර පරීක්ෂණය 2019

# ද මැසිනොද් විදුහල - කඳාන
# De Mazenod College - Kandana
## පෙරදිග සංගීතය

පැය 2

10 ශ්‍රේණිය

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. 1. භෛරවී රාගයේ මධ්‍යලය ගීතය ස්වර ප්‍රස්තාර කරන්න.

2. ඔබ කැමති සර්ගම් ගීතයක් ප්‍රස්ථාර කරන්න.

02. 1. ස්වර ලිපි කියවීමේදී හමුවන පහත සංකේත වල නම් සඳහන් කර විස්තර කරන්න.

[ ]     %     %.     3/4     $

Intro ,Inter , Harmony

03. 1. කපිරිඤ්ඤා ගීතයක් ලියන්න.

2. කපිරිඤ්ඤා වල සංගීතමය ලක්ෂණ 5ක් ලියන්න.

04. 1. ග්‍රැමෆෝන් ගීත ශ්‍රී ලාංකික රසිකයන්ගේ සංගීතමය දැනුම, අභිරුචිකම්, එක්කල ආකාරය ලියන්න.

2. ග්‍රැමෆෝන් ගීයක් ලියන්න.

05. 1. සේ ගීවල ලක්ෂණ 5 ක් ලියන්න.

2. ජන ගීත බොහොමයක් ආනාසාතාත්මක වීමට හේතු ලියන්න.

06. 1.තබ්ලාවක් අඟ කොටස් නම් කරන්න.

2. තබ්ලා අක්ෂරනිපදවන ආකාරය, උපදින ස්ථානය ලියන්න.

07. 1. නිල් අහස් තලේ ගීතයේ ස්වර ප්‍රස්ථාරය ලියන්න.

2. එම කෝමල නිශ්‍රැති කරගෙන නැවත ලියන්න.

3. මුල් ස්වර මධ්‍යම භාවයෙන් ලියන්න.

08. |ප- රි ස|ග - ම ග |ප - - - |ධ - ප ම

|ග රි ගරි ගරි|ස - රි ස|- - ප -|ම - ග ස |

1. මෙහි බටහිර ක්‍රමයට පෙරලා ලියන්න.

2. 𝄞 මෙම සංකේතය හඳුන්වන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana